# උසස් පෙළ 2021
# ආර්ථික විද්‍යාව සම්මන්ත්‍රණය

Bandara Dissanayake

Dr. Ananda Rathnayake

# ගෙවුම් තුලන ලේඛනය
# Balance of Payments (BOP)

**කිසියම් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ දී කිසියම් රටක නේවාසිකයින් හා අනේවාසිකයින් අතර සිදුවන සියලු ම ආර්ථික ගනුදෙනු ක්‍රමානුකූල ව සාරාංශ කර දක්වන සංඛ්‍යාමය ප්‍රකාශනය ගෙවුම් තුලන ලේඛනය නම් වේ.**

# ගෙවුම් තුලන ලේඛනය

- ජංගම හා ප්‍රාග්ධන ගිණුම
  - ජංගම ගිණුම
    - භාණ්ඩ ගිණුම
    - සේවා ගිණුම
    - ප්‍රාථමික ආදායම් ගිණුම
    - ද්විතීයික ආදායම් ගිණුම
  - ප්‍රාග්ධන ගිණුම
- මූල්‍ය ගිණුම
  - සෘජු ආයෝජන
  - විවිධ ආයෝජන
  - මූල්‍ය ව්‍යුත්පන්න
  - අනෙකුත් ආයෝජන
  - සංචිත වත්කම්

# ජංගම ගිණුම
## Current Account

කිසියම් කාලපරිච්ඡේදයක් තුළ දී රටක නේවාසිකයින් හා අනේවාසිකයින් අතර හටගත් භාණ්ඩ, සේවා, ප්‍රාථමික ආදායම් හා ද්විතියික ආදායම් ප්‍රවාහයන් සටහන් කරන ගිණුම ජංගම ගිණුම නම් වේ. මෙය වර්තන ගිණුම ලෙස ද හැඳින්වෙන අතර, උප ගිණුම් හතරකින් සමන්විත වේ.

1. භාණ්ඩ ගිණුම
2. සේවා ගිණුම

(භාණ්ඩ හා සේවා ගිණුම)

2. ප්‍රාථමික ආදායම් ගිණුම
3. ද්විතියික ආදායම් ගිණුම

ජංගම ගිණුමේ ගනුදෙනු ද්විත්ව සටහන් ගිණුම්කරණ සම්ප්‍රදායට අනුව වාර්තා කරයි. වත්කම් වැඩි වීම හා වගකීම් අඩු වීම හර කෙරේ. වත්කම් අඩු වීම හා වගකීම් වැඩි වීම බැර කෙරේ.

# භාණ්ඩ ගිණුම (වෙළෙඳ ගිණුම)

## Goods Account (Trade Account)

---

නිෂ්පාදන ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස නේවාසිකයින් හා අනේවාසිකයින් අතර වෙළෙඳ භාණ්ඩ හා මූල්‍ය නොවන රත්‍රන් අපනයන හා ආනයන (දෘශ්‍ය වෙළෙඳාම) සම්බන්ධ ගනුදෙනු මෙහි ඇතුළත් කෙරේ

**වෙළෙඳ ශේෂය = භාණ්ඩ අපනයන - භාණ්ඩ ආනයන**

මෙය ධන නම් වෙළෙඳ අතිරික්තයක් ද, සෘණ නම් වෙළෙඳ හිඟයක් ලෙස ද හැඳින් වේ.

ශ්‍රී ලංකාවේ වෙළෙඳ ගිණුමේ ඇත්තේ හිඟය කි

# සේවා ගිණුම
## Services Account

නිෂ්පාදන ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස නේවාසිකයින් හා අනේවාසිකයින් අතර බිහි වූ සාධක නොවන සේවා අපනයන හා ආනයන (අදෘශ්‍ය වෙළෙඳුම) ආශ්‍රිත ගනුදෙනු මීට ඇතුළත් වේ.

**සේවා ගිණුමේ ශේෂය = සේවා අපනයන - සේවා ආනයන**

(සේවා ආදායම් ලැබීම්) (සේවා ආදායම් ගෙවීම්)

මෙය ධන නම් සේවා ගිණුමේ අතිරික්තයක් ලෙස ද, ඍණ නම් සේවා ගිණුමේ හිඟයක් ලෙස ද හැඳින් වේ.

ශ්‍රී ලංකාවේ සේවා ගිණුමේ ඇත්තේ අතිරික්තය කි

## සේවා ගිණුමේ ඇතුළත් කරනු ලබන ගනුදෙනු

- ප්‍රවාහන සේවා
- සංචාරක සේවා
- ඉදිකිරීම් සේවා
- රක්ෂණ සේවා හා විශ්‍රාම වැටුප්
  (ජීවිත රක්ෂණ ඔප්පු සඳහා කරන ගෙවීම් හා හිමිකම් ලැබීම)
- මූල්‍ය සේවා
- විදුලි සංදේශ හා පරිගණක සේවා
- වෙනත් ව්‍යාපාරික සේවා
- රජයේ භාණ්ඩ හා සේවා වියදම් (වෙනත් තැනක සඳහන් නොවන)

# භාණ්ඩ හා සේවා ගිණුම
## Goods and Services Account

---

භාණ්ඩ ගිණුමේ සහ සේවා ගිණුමේ ඓක්‍යය, භාණ්ඩ හා සේවා ගිණුම ලෙස දැක්වේ.

ජාතික ගිණුම්කරණයේ දී ශුද්ධ අපනයන ලෙස සලකනුයේ භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය යි.

# ප්‍රාථමික ආදායම් ගිණුම
## Primary Income Account

නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රයෙන් නේවාසිකයින් සහ අනේවාසිකයින් අතර පැන නඟින සාධක ආදායම් ලැබීම් සහ ගෙවීම් ප්‍රාථමික ආදායම් ගිණුමේ සටහන් කෙරේ.

ජාතික ගිණුම්කරණයේ දී **ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම** ලෙස සලකනුයේ මෙය යි.

**ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය = ප්‍රාථමික ආදායම් ලැබීම් - ප්‍රාථමික ආදායම් ගෙවීම්**

මෙය ධන නම් ප්‍රාථමික ආදායම් ගිණුමේ අතිරික්තයක් ලෙස ද, ඍණ නම් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟයක් ලෙස ද හැඳින් වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ආදායම් ගිණුමේ ඇත්තේ හිඟය කි

# ප්‍රාථමික ආදායම් ගිණුමේ ඇතුළත් කරනු ලබන ගනුදෙනු

- සේවක වන්දි

උදා : සේවක වැටුප්, උපදේශක සේවා සඳහා ගෙවීම්, විදේශ තානාපති කාර්යාලවල සහ ජාත්‍යන්තර සංවිධානවල සේවය කරන කාර්යමණ්ඩල සඳහා ගෙවනු ලබන වැටුප් හා දීමනා.

- ආයෝජන ආදායම්

මූල්‍ය වත්කම් හා ආයෝජන (ඍජු ආයෝජන, ශුද්ධ ආයෝජන, වෙනත් ආයෝජන හා සංචිත වත්කම්) ආශ්‍රයෙන් හට ගන්නා.

උදා :- පොලී, ලාභාංශ, ප්‍රති ආයෝජන ඉපැයීම්

- මූල්‍ය නොවන නිෂ්පාදනය නොකළ වත්කම් බදු දීමෙන් උපයා ගනු ලබන ආදායම්

උදා :- බදුකුලී, පුරස්කාර, සන්නම්, ස්වාධිකාර, වරලත් බලපත්‍ර, කීර්තිනාමය ආශ්‍රයෙන් උපයා ගනු ලබන ආදායම්.

# ද්විතීයික ආදායම් ගිණුම
## Secondary Income Account

නේවාසිකයින් හා අනේවාසිකයින් අතර සිදුවන රාජ්‍ය හා පෞද්ගලික සියලු ම ජංගම ස්වරූපයේ සංක්‍රාම මෙහි ඇතුළත් කෙරේ. මේවා මුදල් හෝ භාණ්ඩ යන දෙයාකාරයෙන් ම සිදුවිය හැක.

ජාතික ගිණුම්කරණයේ දී ශුද්ධ විදේශ ජංගම සංක්‍රාම ලෙස සලකනුයේ මෙය යි. ද්විතීයික ආදායම් වර්ග දෙක කි.

(i) පෞද්ගලික වර්තන සංක්‍රාම.
උදා: විදේශ සේවා නියුක්තිකයන් මෙරටට එවන ප්‍රේෂණ

(ii) නිල වර්තන සංක්‍රාම
උදා: විදේශ රජයන් ශ්‍රී ලංකා රජයට ලබාදෙන ආධාර

මෙම සංක්‍රාම ලැබීම් හා ගෙවීම් අතර වෙනස ද්විතීයික ආදායම් ගිණුමේ ශේෂය නම් වේ. එය පහත පරිදි ගණනය කළ හැක.

ද්විතීයික ආදායම් ගිණුමේ ශේෂය = සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ (ශුද්ධ) + ශුද්ධ නිල සංක්‍රාම

මෙය ධන නම් ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තයක් ලෙස ද සෘණ නම් ද්විතියීක ආදායම් ගිණුමේ හිඟයක් ලෙස ද හැඳින් වේ.

(ජීවිත රක්ෂණ නොවන වෙනත් රක්ෂණ ඔප්පු සඳහා කරන ගෙවීම් හා ඒවා වෙනුවෙන් වන හිමිකම් ලැබීම් ද ද්විතීයික ආදායම් ගිණුමේ සටහන් වේ)

# ශ්‍රී ලංකාවේ ජංගම ගිණුමේ ශේෂය 2019

| | | |
|---|---|---|
| **භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය** | | -5,148 |
| භාණ්ඩ ගිණුමේ ශේෂය | -7,997 | |
| සේවා ගිණුමේ ශේෂය | 2,849 | |
| **ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය** | | -2,426 |
| **ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය** | | 5,766 |
| **ජංගම ගිණුමේ ශේෂය** | | -1,808 |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2019)

ශ්‍රී ලංකාවේ ජංගම ගිණුමේ ඇත්තේ හිඟයකි

# ප්‍රාග්ධන ගිණුම
## Capital Account

කිසියම් කාලපරිච්ඡේදයක් තුළ දී නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදු වූ ප්‍රාග්ධන සංක්‍රාම ලැබීම් හා ගෙවීම් ද, නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් හා බැහැර කිරීම් ද මෙහි ඇතුළත් වේ. මෙම ප්‍රාග්ධන ලැබීම් හා ගෙවීම් අතර වෙනස ප්‍රාග්ධන ගිණුමේ ශේෂය නම් වේ.

**ප්‍රාග්ධන ගිණුමේ ශේෂය = ප්‍රාග්ධන ලැබීම් - ප්‍රාග්ධන ගෙවීම්**

මෙය ධන නම් ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තයක් ලෙස ද, සෘණ නම් ප්‍රාග්ධන ගිණුමේ හිඟයක් ලෙස ද හැඳින් වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන ගිණුමේ ඇත්තේ අතිරික්තය කි

# ප්‍රාග්ධන ගිණුමේ ඇතුළත් කරනු ලබන ගනුදෙනු

- ප්‍රාග්ධන සංක්‍රාම

  රාජ්‍ය හා පෞද්ගලික මට්ටමින් ප්‍රාග්ධන සම්පාදන අරමුණින් ඒකපාර්ශ්වීය සම්පත් ලබාදීම හෝ ලබා ගැනීම.

  උදා : - රජයට ව්‍යාපෘති ආධාර ලෙස ලැබුණු ප්‍රදාන
  - රාජ්‍ය නොවන සංවිධානවලින් ලැබුණු ප්‍රදාන
  - ආයෝජන ප්‍රදාන.
  - ණය කපාහැරීම්.

- නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම හා විකිණීම

  උදා : - තානාපති කාර්යාලයකට ඉඩමක් විකිණීම
  - බලපත්‍ර
  - බදු ගිවිසුම් (leases)
  - සන්නම්
  - වරලත් බලපත්‍ර (franchises)
  - කීර්තිනාමය විකිණීම හා මිල දී ගැනීම.

# ශ්‍රී ලංකාවේ ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය 2019

| | |
|---|---|
| ජංගම ගිණුමේ ශේෂය | -1,808 |
| ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | 23 |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | -1,785 |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2019)

# ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය තුළින් ගම්‍ය වන්නේ කුමක් ද?

අදාළ කාලපරිච්ඡේදය තුළ නේවාසිකයන් හා අනේවාසිකයන් අතර ශුද්ධ ණය දීම හෝ ශුද්ධ ණය ගැනීම මෙමඟින් ගම්‍ය වේ. මෙය ධන නම් ශුද්ධ ණය දීමක් ලෙස ද, සෘණ නම් ශුද්ධ ණය ගැනීමක් ලෙස ද හැඳින් වේ.

**ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තය** – ශුද්ධ ණය දීම කි.

**ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ හිඟය** – ශුද්ධ ණය ගැනීම කි.

# මූල්‍ය ගිණුම
## Financial Account

නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන මූල්‍ය වත්කම් හා වගකීම් ආශ්‍රිත ගනුදෙනු සටහන් කරන ගිණුම මූල්‍ය ගිණුම වේ. මූල්‍ය ගනුදෙනුවල කාර්යාත්මක ස්වරූපය මත මූල්‍ය ගිණුමේ උප ගිණුම් පහ කි.

1. සෘජු ආයෝජන
2. විවිධ ආයෝජන
3. මූල්‍ය ව්‍යුත්පන්න
4. අනෙකුත් ආයෝජන
5. සංචිත වත්කම්

සෘජු ආයෝජන, විවිධ ආයෝජන, මූල්‍ය ව්‍යුත්පන්න, වෙනත් ආයෝජන හා සංචිත වත්කම් යනාදී ගනුදෙනුවලින් පැන නඟින සමස්ත ප්‍රතිඵලය මූල්‍ය ගිණුමේ ශේෂය මඟින් නිරූපණය වේ.

- මූලය ගිණුමේ ගනුදෙනු ඒවායේ ශුද්ධ වටිනාකම පදනම් කරගෙන ගිණුම්ගත කරනු ලබන  අතර, සෑම මූලය උපකරණයකට ම අදාළ ගනුදෙනු හඳුනාගෙන වත්කම් හා වගකීම්වලට අදාළ ලැබීම් හා ගෙවීම් පිළිවෙළින් ශුද්ධ අගයන් බවට පත් කිරීමෙන් පසු ගිණුම්ගත කෙරේ.

- මූලය ගිණුමේ වාර්තා වන ශුද්ධ අගයන් මූලය වත්කම් හා වගකීම්වලට අදාළ ව වෙන වෙන ම දැක් වේ.

  උදා : ශුද්ධ වත්කම් යනු, වත්කම් වැඩිවීම් හා අඩුවීම් අතර වෙනස වේ.
  ශුද්ධ වගකීම් යනු, වගකීම් වැඩිවීම් හා අඩුවීම් අතර වෙනස වේ.

- මූලය ගිණුමේ ශීර්ෂ දක්වා ඇත්තේ "**මූලය වත්කම්වල ශුද්ධ අත්කර ගැනීම්**" හා "**මූලය වගකීම්වල ශුද්ධ වෙනස්වීම්**" ලෙස වේ. වත්කම්වල ශුද්ධ අත්කර ගැනීම් "හර" වශයෙනුත්, වගකීම්වල ශුද්ධ වෙනස්වීම් "බැර" වශයෙනුත් සැලකේ.

# මූලය ගිණුමේ උප ගිණුම්

1. සෘජු ආයෝජන
    - සෘජු ආයෝජකයින්, සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි කොටස්වල ආයෝජනය (ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල, ලියාපදිංචි නොවූ සහ වෙනත් සමාගම්වල)
    - ප්‍රති ආයෝජිත ඉපැයුම් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ආයෝජන
    - සෘජු ආයෝජකයින්, සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ණය උපකරණවල ආයෝජන

2. විවිධ ආයෝජන (කළඹ ආයෝජන)
    - කොළඹ කොටස් වෙළෙඳ පොළෙහි ලියාපදිංචි සමාගම්වල කොටස්
    - තැන්පත් භාරගන්නා ආයතනවල ණය සුරැකුම්පත්
    - රජයේ කෙටි කාලීන හා දිගු කාලීන ණය සුරැකුම්පත්

3. **මූල්‍ය ව්‍යුත්පන්න**

අනාගත නිශ්චිත දිනයක දී නිශ්චිත මිලකට හෝ වටිනාකමකට හෝ පියවීම පිණිස කිසියම් මූල්‍ය වත්කමක් මිල දී ගැනීමට හෝ විකිණීමට එකඟවනු ලබන ගිවිසුම් ය.

4. **අනෙකුත් ආයෝජන**

- මුදල් හා තැන්පතු
- මහ බැංකුව, රජය සහ තැන්පතු භාර ගන්නා අනෙකුත් ආයතන ලබා ගන්නා ණය
- වෙළෙඳ ණය හා අත්තිකාරම්
- අනෙකුත් ලැබිය යුතු / ගෙවිය යුතු ගිණුම්

5. **සංචිත වත්කම්**

- මූල්‍ය රන්
- විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි)
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ ගැනුම් හිමිකම්
- සාමාජික රට සතුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංචිත පහසුකම්
- අනෙකුත් සංචිත වත්කම් ( විදේශ ව්‍යවහාර මුදල් හා තැන්පතු, විදේශ ණය සුරැකුම්පත්)

# ශ්‍රී ලංකාවේ මූල්‍ය ගිණුමේ ශේෂය 2019

| | මූල්‍ය වත්කම්වල ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්වල ශුද්ධ වෙනස්වීම් | ශුද්ධ ශේෂය |
|---|---|---|---|
| සෘජු ආයෝජන | 77 | 758 | -681 |
| විවිධ ආයෝජන | - | 2,303 | -2,303 |
| මූල්‍ය ව්‍යුත්පන්න | - | - | - |
| අනෙකුත් ආයෝජන | 100 | -114 | 214 |
| සංචිත වත්කම් | 337 | - | 337 |
| මූල්‍ය ගිණුමේ ශේෂය | 514 | 2,947 | -2,432 |

(මූලාශ්‍රයः ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2019)

# මූල්‍ය ගිණුමේ ශේෂය තුළින් ගම්‍ය වන්නේ කුමක් ද?

කිසියම් රටක ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමේ සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂවල එකතුව, එම රට අවශේෂ ලෝකය සමඟ ශුද්ධ ණය හිමියෙක් ද? (ගෙවුම් තුලන අතිරික්තයක්) නැතහොත් ශුද්ධ ණය ගැතියෙක් ද? (ගෙවුම් තුලන හිඟයක්) යන්න පෙන්නුම් කරයි.

ජංගම සහ ප්‍රාග්ධන ගිණුම් ශේෂවල එකතුව සංකල්පමය වශයෙන් මූල්‍ය ගිණුමේ ශේෂයට සමාන විය යුතු ය. වෙනත් වචනවලින් සඳහන් කරනවා නම් මූල්‍ය ගිණුම නිරූපණය කරනුයේ කිසියම් රටක ශුද්ධ ණයහිමි බව හෝ ශුද්ධ ණයගැති බව මූල්‍යනය කෙරෙන ආකාරය යි. ජංගම හා ප්‍රාග්ධන ගිණුම්වල ශුද්ධ ශේෂය මූල්‍ය ගිණුමේ ශේෂයට අවශ්‍යයෙන් ම සමාන විය යුතු ය.

# වැරදි හා අත්හැරීම්
## Errors and Ommissions

සමහර විදේශ ගනුදෙනු, නිල වාර්තාවලට ඇතුළත් නොවීම හෝ සමහර ගනුදෙනු වැරදි ලෙස වාර්තා වීම නිසා දත්ත ශ්‍රේණි අතර නො ගැලපීමක් පවතින අවස්ථාවක දී ගෙවුම් තුලන ලේඛනය තුලනය නොවී පැවතිය හැකි ය. එවැනි කිසියම් සංඛ්‍යානමය වරදක් නිසා අසමානතාවක් හට ගතහොත් 'ශුද්ධ වැරදීම් හා අත්හැරීම්' යන අයිතමය යොදා ගනිමින් එම සමානත්වය ඇති කෙරේ.

# ශේෂ පත්‍රය

ශේෂ පත්‍ර ලේඛනයක සියලු ගනුදෙනු ද්විත්ව සටහන් ක්‍රමය අනුගමනය කරමින් වාර්තා කරන නිසා හර අගයන්ගේ එකතුව බැර අගයන්ගේ එකතුවට සමාන විය යුතු බැවින් ශේෂ පත්‍ර ලේඛනය අනිවාර්යෙන් ම තුලනය විය යුතු වේ.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ශේෂ තුලනය | = | ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | + | මූල්‍ය ගිණුමේ ශේෂය | + | වැරදි හා අත් හැරීම් | = | 0 |

# ගෙවුම් තුලන ලේඛනයේ සමස්ත ශේෂය
## Overall Balance

කිසියම් කාලපරිච්ඡේදයක් තුළ දී ශුද්ධ විදේශ සංචිත තත්ත්වයේ වෙනස්වීම සමස්ත ශේෂය ලෙස හැඳින් වේ. නැතහොත් කිසියම් කාලපරිච්ඡේදයක් ආරම්භයේ ශුද්ධ විදේශ සංචිත හා එම කාලපරිච්ඡේදය අවසානයේ ශුද්ධ විදේශ සංචිත අතර වෙනස යි.

සමස්ත ශේෂය = කාලපරිච්ඡේදය අවසානයේ දී ශුද්ධ විදේශ වත්කම් - කාලපරිච්ඡේදය ආරම්භයේ දී ශුද්ධ විදේශ වත්කම්

සමස්ත ශේෂය = ශුද්ධ නිල විදේශ සංචිතවල වෙනස්වීම

# Exercise

❖ පහත සඳහන් ගනුදෙනු ගෙවුම් තුලන ලේඛනයට ඇතුළත් කරන්නේ ද? නැද්ද? යන්න සඳහන් කරන්න. ඇතුළත් කරන්නේ නම් ඒ කවර ගිණුමක ද? යන්න දක්වන්න.

1. ශ්‍රී ලංකාවේ පිහිටි ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් ගඩොල් තොගයක් මිල දී ගැනීම.

2. වසර දහයක කාලයක් ඉතාලියේ සේවය කළ ශ්‍රී ලාංකිකයෙක්, සිය සේවා කාලය අවසන් කර යළි මව් රටට පැමිණීමේ දී මෝටර් රථයක් රැගෙන ඒම.

3. වියට්නාමයේ සිට මෙරරට ගම්මිරිස් ආනයනය කර ඉන්දියාවට ප්‍රති අපනයන කිරීම

4. ශ්‍රී ලංකාවට අයත් මුහුදු කලාපයේ දී ගිනි ගෙන විනාශ වූ නැවකින් මෙරටට සිදු වූ හානිය වෙනුවෙන් විදේශීය රක්ෂණ සමාගමකින් වන්දි ලැබීම

5. ඩුබායි හි ඉදිකිරීම් ආයතනයක සේවය කරමින් සිටිය දී හදිසි අනතුරකින් මිය ගිය ශ්‍රී ලාංකික ඉංජිනේරුවෙකු ලබාගෙන තිබූ ජීවිත රක්ෂණයක් වෙනුවෙන් එම රටෙන් ඔහුගේ පවුලට රක්ෂණ වන්දියක් ගෙවීම.

6. මෙරටින් සොයා ගැණුනු වටිනා මැණික් පොකුරක් විදේශීය වෙන්දේසියක දී අලෙවි වීම.

7. ඇමරිකාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්‍යාලයේ මෙහෙයුම් වියදම්

8. ශ්‍රී ලංකා රජය බංගලාදේශයෙන් SWAP ගිවිසුමක් හරහා ඇමරිකානු ඩොලර් මිලියන 250ක් ලබා ගැනීම

❖ පහත දැක්වෙන විදේශ ගනුදෙනුවල හර හා බැර සටහන් ගෙවුම් ශේෂ ලේඛනයක කොතැනට සටහන් කරයි ද? යන්න දක්වන්න. වත්කම් හා වගකීම් වෙනස් වීම ද දක්වන්න.

1. ශ්‍රී ලංකාවට පැමිණි ඇමෙරිකානු සංචාරකයෙක් ශ්‍රී ලංකාවෙන් තේ කිලෝ පහක් මිල දී ගෙන යාම.

2. ශ්‍රී ලාංකික ආනයනකරුවෙක් ණය පදනම මත විදේශීය ව්‍යාපාරිකයෙකුගෙන් සීනි තොගයක් මිල දී ගැනීම.

3. ඉන්දියානු රජය ශ්‍රී ලංකාවට සුව සැරිය ගිලන් රථ දහයක් පරිත්‍යාග කිරීම.

4. ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ පුහුණුකරු තනතුරට මාස හයක කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් විදේශීය පුහුණුකරුට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගෙවන වැටුප

5. මෙරට ව්‍යවසායකයෙක් බංගලාදේශයේ ඇඟලුම් කර්මාන්තශාලාවක් ආරම්භ කිරීම.

6. එක්තරා ඖෂධ වර්ගයක් දේශීය ව නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් අදාළ පේටන් බලපත්‍රය හිමි විදේශීය ඖෂධ නිෂ්පාදන සමාගමට සිදු කරන ගෙවීම්.

7. ලෝක සෞඛ්‍ය සංවිධානයේ කොවැක්ස් පහසුකම යටතේ මෙරටට කොවිඩ් 19 මර්දන එන්නත් තොගයක් ලැබීම.

8. චීනය විසින් ශ්‍රී ලංකා රජය ලබා ගෙන ඇති ණයවලින් කොටසක් කපා හැරීම.

9. ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කර ඇති ආයෝජකයින්ට පොලී ගෙවීම.

10. Zoom තාක්ෂණය ඔස්සේ පන්ති පවත්වන මෙරට අධ්‍යාපන ආයතනයක් විසින් එම මෘදුකාංගය වෙනුවෙන් Zoom ආයතනයට කරනු ලබන මාසික ගෙවීම්.

- විදේශ විනිමය අනුපාතිකය ක්ෂය වීම රටක ගෙවුම් තුලන ලේඛණයට බලපානු ලබන්නේ කෙසේ ද?

- ශ්‍රී ලංකාවේ විදේශ සංචිත පහල යාමේ ආර්ථික ප්‍රතිවිපාක මොනවා ද?

# Thank You!